# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 606/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 08/04/2024 පැය 1410

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01. 2024.04.07 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 06 | 06 | 151 | 445 | තඹ දඟර 03<br>යකඩ බැරල් 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

**2024.04.07 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වත්තල පොලිස් වසමේ හැඳල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වත්තල පොලිස් ස්ථානයට භාරදී ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වූ හැඳල, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**03.** **නීතිවිරෝධි මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

**2024.04.07** වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත උප්පුවේලි පොලිස් වසමේ ආනන්දපුරි ප්‍රදේශයේ වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පෙති **42**ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන උප්පුවේලි පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.

උප්පුවේලි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **ගංජා හේනක් වැටලීම - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

**2024.04.07** වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හම්බේගමුව පොලිස් වසමේ රතඹලාව ප්‍රදේශයේදී ගංජා හේනක් වටලා ගංජා ගස් **8770**ක් සැකකරුවෙකු නොමැතිව අත්ඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා හම්බේගමුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වා ගෙන යනු ලබයි.

**05.** **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට -පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර**

**2024.04.07** වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිකන්ද පොලිස් වසමේ මගුල් පොකුණ ප්‍රදේශයේ වැටලීමක් සිදු කර පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු කැණීම් උපකරණ සමග අත්අඩංගුවට ගෙන වැලිකන්ද පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 73 යන වයස් වල පසුවන වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.

වැලිකන්ද පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.